ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2022.03.03 |

පැමිණිලිකරුවන් : 01. තරිඳු ජයවර්ධන මහතා,
ප්‍රධාන සංස්කාරක,
Media.lk.com වෙබ් අඩවිය.

02. ලේකම්/සභාපති,
ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය,
අංක 176/3, ඔරුතොට,
ගම්පහ.

වගඋත්තරකරුවන් : 01. සභාපති,
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම,
අංක: 267, වෛද්‍ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ - 02.

02. සභාපති,
පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,
සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
තැ.පෙ. 1581,
අංක 27, වොක්ෂෝල් වීදිය,
කොළඹ - 02.

03. ලේකම්,
සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය,
8 වන මහල, HQ කොළඹ ගොඩනැගිල්ල, අංක 464/ඒ, ටී.බී. ජායා මාවත,
කොළඹ - 10.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் — 011-2505451
ෆැක්ස් / தொலைநகல் — 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் — sechrc@gmail.com

04. අධ්‍යක්ෂ ජනරාල්,

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය,

අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත,

කොළඹ - 08.

05. සභාපති,

මහජන උපයෝගිතා කොමිෂන් සභාව,

6 වන මහල, BOC වෙළඳ කුළුණ,

අංක 28, ශාන්ත මයිකල් පාර,

කොළඹ - 03.

06. පොලිස්පති,

පොලිස් මූලස්ථානය,

කොළඹ - 01.

වගකිව යුතු ආයතන : 01. සභාපති,

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

අංක: 609, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,

කොළඹ - 09.

02. සභාපති,

ලාෆ් ගෑස් ඔටෝ ලංකා පුද්ගලික සමාගම,

අංක: 101, මායා ඇවනියු,

කොළඹ - 06.

03. සභාපති,

කාර්මික තාක්ෂණ ආයතනය (ITI)

අංක 363, බෞද්ධාලෝක මාවත,

කොළඹ - 07.

04. ප්‍රධාන තක්සේරුකරු

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව,

තක්සේරු මන්දිරය, අංක 748, මරදාන පාර,

කොළඹ - 10.

**<u>මානව හිමිකම් කොමිෂන් සභාව විසින්ම පැමිණිල්ල ආරම්භ කිරීම :-</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරණ පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව විද්‍යුත් මාධ්‍ය මඟින් ගෑස් උඳුන් හා ගෑස් සිලින්ඩර ආශ්‍රිතව පිපිරීම් වාර්තාවීමත්, ඒ ආශ්‍රිතව සිදුවූ ජීවිත හානි සහ දේපල හානි වාර්තාවීමත් නිරීක්ෂණය වීමෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිල්ලක් ආරම්භ කරන ලදී. එහිදී මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනයේ අවධානය යොමු කරන ලද්දේ මෙම සිදුවීම්වලට වගකිව යුතු ආයතනවල ක්‍රියා පටිපාටිය හා එම ආයතනයන් නියාමනය කිරීමට වගකීම් පැවරී ඇති රාජ්‍ය ආයතනවල ක්‍රියාත්මකවීම කුමන ආකාරයෙන් සිදුවන්නේද යන්නත් එම ක්‍රියාදාමය රාජ්‍ය ආයතනයන්වලට නිර්දේශ නිකුත් කිරීමත්ය.

මෙම පැමිණිල්ල විමර්ශනයේදී දෛනිකව මාධ්‍ය වාර්තාවීමත් මඟින් හෙළිවන පිපිරීම් ආශ්‍රිතව ජීවිත හා දේපල හානි පිළිබඳවත් එම හානි පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව අනුගමනය කළ ක්‍රියා පටිපාටියත්, කොරෝනා වැනි දරුණු වසංගත තත්වයකට මුහුණදී ඉතාමත් ආර්ථික හා සමාජීය මෙන්ම මානසික පීඩනයන්හි වින්දිතව සිටින මහජනතාවගේ දෛනික කටයුතු අඩාලවීම, ව්‍යාපාර වසා දැමීමට සිදුවීම හා ගෑස් ලබාගැනීමේ අරමුණෙන් දිගු පෝලිම්වල පැය ගණනක් රැඳී සිටීමට සිදුවීම, ගෑස් භාවිතයට බියක් ඇති කරවීම යන හේතුවලින් පීඩන තත්වයන්ට සිදුවූ අගතිය සම්බන්ධනේ එහිලා වගකිව යුතු යැයි හඳුනාගත් රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරීත්වය පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරන ලදී.

**<u>පැමිණිලි අංක :-</u>**

1. HRC/RM/SUO-MOTU/01/2021
2. HRC/HO/2781/21

**<u>හැඳින්වීම :-</u>**

2021 වර්ෂයේ අප්‍රේල් මාසයෙන් ආරම්භ වූ ගෑස් සිලින්ඩරවල ප්‍රමිතිය හා ගෑස් භාවිතයේදී සිදුවූ පිපිරීම් පිළිබඳව විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මඟින් ප්‍රචාරණයවීමත් සමඟ ඒ පිළිබඳව විමර්ශනයක් HRC/RM/SUO-MOTU/01/2021 පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලදී.

ගෑස් සිලින්ඩර ආශ්‍රිතව පිපිරීම් වාර්තාවීම හේතුවෙන් 1වන හා 2වන පැමිණිලිකරුවන් විසින් HRC/HO/2781/21 යටතේ කොමිෂන් සභාවේ පැමිණිල්ල ගොනු කරන ලදී.

පැමිණිල්ල :-

පසුගිය මාස කිහිපය තුල හා මේවන විට ද වාර්තා වෙමින් පවතින ගෑස් සිලින්ඩර ආශ්‍රිතව පිපිරීම් හේතුවෙන් මහජනතාව අපහසුතාවයට පත්වීමත්, ගෑස් නිෂ්පාදනය කරන සමාගම් විසින් නියමිත ප්‍රමිතියෙන් තොරව ගෑස් නිෂ්පාදනය කිරීම පිළිබඳව සොයා බැලීම සඳහා පවතින රාජ්‍ය ආයතනයන් විසින් ඔවුන්ගේ රාජකාරී පැහැර හැරීම පිළිබඳවත් ලිට්‍රෝ හා ලාෆ් යන ගෑස් සමාගම් විසින් රාජ්‍ය ආයතනයක් විසින් නිකුත් කර ඇති නීති රීතින් පිළිපැදීමට කටයුතු නොකිරීම හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතායන් පිළිබඳව කොමිෂන් සභාවේ වගඋත්තරකාර පාර්ශවයන් වගකීම බාර නොගැනීම හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් නිකුත් කර ඇති 2009/09/30 දිනැති අංක 1621/19 දරණ ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ගෑස් සංයුතියේ පැවතිය යුතු අනුපාතයන් වෙනසකට භාජනය කර ගෑස් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීම තුළින් පාරිභෝගික ජනතාවට සිදුවන අගතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනයක් සිදුකොට සුදුසු සහනයන් ලබාදෙන ලෙස ඉල්ලමින් පැමිණිලිකරුවන් විසින් ඉල්ලා සිටී.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම:-

01. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කරුණු දැක්වීම

- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත ප්‍රකාරව මෙම සිදුවීම සම්බන්ධයෙන් කටයුතු කර ඇති බව පවසා සිටී. ඒ අනුව අධිකාරිය විසින් ගෘහස්ථ එල්.පී. ගෑස් සම්බන්ධව ගැසට් නිවේදන නිකුත් කර ඇති බවත් එකී නිවේදන හා පනත ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බවත්,
- ගැසට් අංක 1577/4 දරණ හා 2008.11.25 දිනැති ගැසට් පත්‍රය මගින් ගෑස් අලෙවි කරන ස්ථානයේ බර කිරා බැලීම සඳහා තරාදියක් අලෙවි ස්ථානය තුළ තිබිය යුතු බවත්,
- ගෑස් භාවිතයට අවශ්‍ය උපාංග එනම් ගෑස් සිලින්ඩර්, වැල්වු රෙගියුලේටර් බට ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල විය යුතු බවට 2012/01/27 දිනැතිව අංක 1742/27 දරණ ගැසට් පත්‍රය නිකුත් කර ඇති බවත්,
- ගෑස් බර කිලෝග්‍රෑම් වලින් පමණක් අඳහන් කර අලෙවි කළ යුතු බවට දන්වමින් අංක 2237/41 දරණ ගැසට් පත්‍රය 2021/07/05 වන දින නිකුත් කර ඇති බවත්,
- ලිට්‍රෝ ගෑස් සමාගම විසින් 2021/04/09 දිනැති ලිපියෙන් එම සමාගම විසින් ලීටර් 18කින් යුත් නව ගෘහස්ථ ගෑස් සිලින්ඩරයක් වෙළඳපොළට හඳුන්වා දෙන බව දැනුම් දීමෙන් අනතුරුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2021/04/20 වන දින එම හඳුන්වාදීම වෙළඳපොලෙන් ඉවත්

කරගන්නා ලෙස දැන්මිදී ඇති අතර, 2021/04/20 හා 21 යන දිනවල වෙළඳපොලෙන් සාම්පල් ලබාගෙන 2021/04/23 ඉන්ටෙර්ටෙක් රසායනාගාරය වෙත යොමු කර ඇති බවත් කියා සිටී.

- එකී යොමුකිරීමට අදාළව ඉන්ටෙර්ටෙක් ආයතනයේ වාර්තා අධිකාරිය වෙත ලැබීමෙන් අනතුරුව මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයේ 2021/06/16 වන දින අංක 1288/21 දරණ නඩුවක් ලිට්‍රෝ ගෑස් සමාගමට එරෙහිව පැවරූ බවත් මේවන විට එය අධිකරණයේ විභාග වන බවත් දන්වා ඇත.
- එකී නඩුවෙන් දන්වා ඇත්තේ ද්‍රවිකෘත ප්‍රෙට්‍රෝලියම් වායුව අඩංගු 12.5kg ගෘහස්ථ සිලින්ඩරයක 12.5kg යන්න මකා දමා 18L ලෙස සඳහන් කිරීම තුළින් පාරිභෝගික ජනතාව නොමග යැවීමට හා වංචා සහගත අලෙවිය තුළින් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ 10(3), 10(1) සහ 60(5) යන වගන්ති උල්ලංඝණය කිරීම පිළිබඳ වේ.
- එසේම නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 29626 යටතේ 2021.06.30 වන දින 18L ගෘහස්ථ ගෑස් සිලින්ඩරය හඳුන්වාදීම තුළින් පාරිභෝගිකයන් නොමඟ යැවීම තුළින් වරදක් කර ඇති බව දක්වමින් ලාෆ් ගෑස් සමාගමට එරෙහිව නඩු පවරා ඇති බවත්,
- ගෘහස්ථ ගෑස් භාවිතයෙන් දිගින් දිගටම පිපිරීම් වාර්තාවීම හේතුවෙන් සමාගම් දෙකටම අදාළ ගෑස් සිලින්ඩර් සාම්පල් ඉන්ටෙර්ටෙක් ආයතනයේ පරීක්ෂාවට යොමු කිරීමෙන් පසුව ගෘහස්ථ ගෑස් පාරිභෝගික ජනතාවගේ ජීවිත හෝ දේපළ වලට විය හැකි අවධානම් තත්වයන් වළක්වාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට ලිපි මඟින් දැනුම් දීම් සිදුකර ඇති බවත්,
- ගෑස්වල ගන්ධය ඇති කිරීම සඳහා යොදා ගන්නා මර්කැප්ටන් නැමති ද්‍රව්‍ය සමාගම් දෙකෙහිම නිෂ්පාදිත ගෑස් සිලින්ඩර වල අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් ඇති බවට ඉන්ටෙර්ටෙක් රසායනාගාරය විසින් නිකුත් කළ වාර්තාවේ සඳහන්වීම නිසා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2021/12/02 දිනැති ලිපියෙන් සමාගම් දෙකටම ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩර වෙළඳපොළට නිකුත් කිරීම අත්හිටුවන ලෙසට දැනුම් දී ඇති බවත්, රිට් ආඥා අංක CA(Writ)/609/2021 තීන්දුව ප්‍රකාරව කටයුතු කරන ලෙසට සමාගම් දෙකටම දැනුම්දී ඇති බවත් 2021/12/02 ලිට්‍රෝ සමාගමට අයත් ගෑස් නැවකින් ගෑස් සාම්පල් ලබාගෙන පරීක්ෂණාගාර වලට යවා ඇති බවත් දන්වා සිටී.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත ගෑස් සංයුතිය නියාමනය කිරීමටත් උපකරණවල ප්‍රගතිය පරීක්ෂා කිරීමේ අවශ්‍යතාවයත් ලිපිවලින් දන්වා යවා ඇත.

## 02. <u>ලිට්‍රෝ සමාගමේ කරුණු දැක්වීම</u>

- 2020 - 2022 වර්ෂයන් සඳහා ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් සැපයුම් ආයතනය හා ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සමඟ ගිවිසුම් අංක LGLL/LPG/094/ICB/2022 යටතේ 2020/02/24 දින ඇති කරගන්නා ලද ගිවිසුම් ප්‍රකාරව ගෑස් සැපයුම් ක්‍රියාවලියේ යෙදී සිටින බවත්,

- මෙම ගිවිසුමට අනුමැතිය ලැබී ඇත්තේ කැබිනට් මණ්ඩලයේ කමිටුවක් විසින් බවත්, එම ගිවිසුම ප්‍රකාරව ගෑස්වල සංයුතිය වන්නේ බියුටේන් (Butane) 60%-75% අතරත් ප්‍රොපේන් (Propane) 25%-40% ත් අතර පැවතිය යුතු වුවත් 2021 ජනවාරි මාසයේ සිට එම සංයුතිය වෙනස්වී ඇති බවත් ප්‍රකාශ කර සිටී.
- 2021 අගෝස්තු මාසයේ සිට නැවතත් ගිවිසුම් ප්‍රකාරව ගෑස් සංයුතිය පවත්වාගෙන යාමට වත්මන් සභාපති විසින් කටයුතු කර ඇති බව ද ප්‍රකාශ කර සිටී.
- 2021 ජනවාරි මාසයේ සිට මෙලෙස ගෑස් සිලින්ඩර ආශ්‍රිත පුපුරායෑම් හා ගිනි ගැනීම් වාර්තා වීමට පටන්ගැනීමත් සමඟ මාධ්‍ය මඟින් දිනෙන් දින එවැනි සිදුවීම් ප්‍රචාරණය වීම සිදුවීම. ඒ අනුව 2021/04/20 පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ලිට්‍රෝ සමාගමට කළ දැනුම්දීමේදී මෙලෙස ප්‍රශ්ණ සහගත ගෘහස්ථ ගෑස් සිලින්ඩර බෙදාහැරීම නතර කිරීමටත් එතෙක් වෙළඳපොලට නිකුත් කර තිබූ ගෑස් සිලින්ඩර නැවත සමාගමෙන් ආපසු ලබාගැනීමෙන් අනතුරුව ඒවා හම්බන්තොට ගබඩාවේ ගබඩා කර තැබීමටත් කටයුතු කළ බව දන්වා සිටී. කිසිම හේතුවක් නිසාවෙන් එම තොග නැවත වෙළඳපොළට නිකුත් කිරීමක් සිදුනොවූ බවත් කියා සිටී.
- ඉන් අනතුරුව නැවත නිකුත් කළ සිලින්ඩර රතු ලේබලයක් සහිතව සංයුතිය ප්‍රදර්ශනය වන අයුරින් වෙළඳපොළට නිකුත් කළ බවත්, එම ලේබලය සකස්කිරීම යන්ත්‍ර මඟින් සිදුනොකළ යුතු බැවින් පෙර ලේබලයේ කොටසක් ද එම ලේබලයට යටින් තිබූ නමුත් ප්‍රකාශිත ගෑස් සංයුතිය එහි අඩංගුව පවතින බවද ප්‍රකාශ කර සිටී.
- මේ දක්වාම ගෑස් සංයුතියන් වෙනස්වීම මෙමඅනතුරුවලට හේතුවී ඇති බව විද්‍යාත්මක පරීක්ෂණයක් සිදුකිරීමෙන් හෝ තහවුරු කිරීමක් සිදුවී නොමැති බවත්,
- බොහෝ විට මෙලෙස අනතුරු සිදුවීමට හේතුවී ඇත්තේ ප්‍රමිතියෙන් තොර ගෑස් උඳුන්, රෙගියුලේටර් හා ගෑස් උඳුන්වලට යොදන බට වැනි උපාංග භාවිතා කිරීම නිසා බවත්, යම් හෙයකින් ගෑස් පාරිභෝගිකයෙකු අනතුරකට හෝ ජීවිතක්ෂයට පත්වන්නේ ගෑස් සිලින්ඩරයේ හෝ ගෑස්වල ඇති වූ හේතුවක් නිසාවෙන් නම් මිලියනයකට වැඩි රක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වාදී ඇති බවද කියා සිටී.
- එසේම ගෑස් අනතුරු හේතුවෙන් මරණ තුනක් වාර්තා වී ඇති නමුත්, එම මරණ සම්බන්ධව අදාළ පොලිස් පරීක්ෂණවලට අදාළ වාර්තා වලින් පෙනීයන්නේ සියදිවි හානිකර ගැනීම්, ඇඳුමට ගිනි ගැනීම හා වෙනත් කටයුතු සඳහා භාවිතා කරන බට ගෑස් භාවිතය සඳහා යොදාගැනීම් වැනි හේතුන් මත බව කියා සිටී.
- ලිට්‍රෝ සමාගම කිසිදු අවස්ථාවක ජනතාව මත වගකීම බාර නොදෙන බවත්, ගෑස් ආශ්‍රිත භාවිත උපකරණ සඳහා නියාමනයන් නොමැති බැවින් මෙම ගැටළුව නිර්මාණය වූ බවත් කියා සිටින අතරම 2021 අප්‍රේල් මස 09 වෙනි දින වෙළඳපොලට නිකුත් වූ ලීටර් 18 සිලින්ඩරයෙහි පීඩනය ප්‍රමිති ආයතනය නියම කර ඇති පීඩනයට අනුකූලව තිබුණද දුර්වල හා ප්‍රමිතියෙන් තොර උපාංග

භාවිතය නිසා පිපිරීම් වැනි අනතුරු සිදුවිය හැකි අවස්ථාවන් පිළිබඳව බවට එවකට සිටි පාලන අධිකාරිය කටයුතු නොකිරීමටද වරදක් බවත් කියා සිටී. 2021 ජුලි 08 වන දින සභාපතිධූරය මාරුවීමත් සමඟ ප්‍රශ්ණගත සිලින්ඩර වෙළඳපොලට නිකුත් කිරීම නතර කළ බවත් කියා සිටී.

03. **ලාෆ් ගෑස් සමාගමේ කරුණු දැක්වීම**

- ගෑස් නිෂ්පාදනයේදී ලෝක නිර්ණායකයන්ට අනුව හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ලබාදි ඇති නිර්ණායකයන්ට අනුව ඇසුරුම් කර අලෙවිය සිදුකරන බවත්, ලාෆ් ගෑස් සමාගම විසින්ම ගෘහස්ථ ගෑස් පරිභෝජනය සඳහා උපාංග නිෂ්පාදනය කරන බවත් ඒවා මිලදී ගැනීමට අදාළව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ නිරන්තරව ප්‍රචාරණ කටයුතු සිදුකරන බවත් කියා සිටී. ලාෆ් සමාගමෙන්ම නිෂ්පාදනය කරන ලද ගෑස් සිලින්ඩර වලට අදාළ රෙගියුලේටර්, බට හා ගෑස් භාවිතය මැනීම සඳහා භාවිතා කළ හැකිවීම, භාවිතා නොකිරීමත් ඒ සඳහා දුර්වල උපාංග භාවිතය නිසා ගෑස් සිලින්ඩර් ආශ්‍රිත පිපිරීම් වාර්තා වීමට හේතුවී ඇති බවත්, ගෑස් පරිභෝජනයේදී භාවිතා කළ යුතු ආරක්ෂණ විධික්‍රම පාරිභෝගිකයින් විසින් භාවිතා නොකිරීමත් මෙම තත්වයට හේතු වී ඇති බව කියා සිටී. ලාෆ් ආයතනය විසින් ගෑස් භාවිතයේදී භාවිතා කළ යුතු ආරක්ෂන විධි ක්‍රමයන් පිළිබඳව නිරන්තරයෙන් පාරිභෝගික ජනතාව දැනුවත් කරන වැඩසටහන්, මාධ්‍ය සාකච්ඡා, පෝස්ටර් යනාදිය මඟින් සිදුකරන බවත් කියා සිටී.
- ආයතනික වරදකින් 1% ක ප්‍රමාණයක් වැනි ගෑස් කාන්දුවීම් සිදුවන අවස්ථා තිබීමට හැකියාව ඇති අවස්ථාවකදී සමාගමේ නියෝජිත කණ්ඩායම් ලවා ඒවා පරීක්ෂා කර නිවැරදි කිරීමට කටයුතු කරන බවත් කියා සිටී.
- සමාජ මාධ්‍ය මඟින් ගෑස් සංයුතිය පිළිබඳ නිවැරදි තොරතුරු මුදාහැරීම නොකිරීම නිසා මෙවැනි තත්වයන් සිදුවන බවත් කියා සිටී. මේ දක්වා කිසිම අවස්ථාවක ගෑස් සංයුතියේ වෙනස්වීමක් නිසා මෙවැනි තත්වයක් සිදුවූ බව හෝ කුමන හෝ වෙළඳ නාමයක් යටතේ පවතින උපාංග භාවිතයෙන් පමණක් පිපිරීම් සිදුවී නැති බවට හෝ පරීක්ෂණයක් මේ දක්වා සිදුකර නොමැති බවත් කියා සිටී.
- වසර ගණනාවක් තිස්සේ ප්‍රොපේන් සංයුතිය (Propane) 70%-30% අනුපාතයකට හා බියුටේන් (Butane) අනුපාතය 30%-40% වීමට හැකියාව පවතින බවත් එයට හේතු වන්නේ 10% ටොලරන් (tolerant) වාසියක් ඇතිවීමයි. දළ වශයෙන් ගෑස් සිලින්ඩරයක පීඩනය 5.5 ක් වේ. එය ලංකා ප්‍රමිති ආයතනයෙන් ලබාදී ඇති සම්මත නිර්ණායක පරාසය එයයි.
- සෑම ගෑස් සිලින්ඩරයක්ම අවුරුදු 05 ක් සම්පූර්ණවීමත් සමඟ ප්‍රතිසංස්කරණය කරන බවත් කියා සිටී.
- ගෑස් කාන්දුවීම් පිළිබඳ ලාෆ් සමාගමට ඇති පැමිණිලි ඉතා අඩු ප්‍රමාණයක් බවත්,

- පාරිභෝගික අධිකාරිය සහ ජනධිපති කාර්ය සාධන බලකායෙන් ප්‍රමිතිගත කර තිබෙන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට ලාෆ් සමාගම කටයුතු කරන බවත්, එහිදී තීරණය වී ඇත්තේ සිලින්ඩර 1000 කට එකක් සිලින්ඩරවල පීඩනය මනින ලෙසය. නමුත් ආයතනය විසින් සෑම සිලින්ඩරයකම පීඩනය මැනීම සිදුකර ඇති බව දන්වා සිටී.

04. කාර්මික තාක්ෂණ ආයතනය (ITI) කරුණු දැක්වීම

- ගෑස් අනුපාතයන් පිළිබඳව මෙ පමණ කලක් පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍යතාවයක් නොතිබුණේ එවැනි ඉල්ලීම් කිසිවක් මීට පෙර කිසිදු ආයතනයකින් ඉදිරිපත් නොතිබූ බැවිනුත්, ප්‍රොපේන් හා බියුටේන් අනුපාතය සම්බන්ධව පරීක්ෂා කර වාර්තා ලබාදීමට තම ආයතනයට රසායනාගාර පහසුකම් නොමැති බවත් කියා සිටී. මේ දක්වා ගෑස් සම්බන්ධයෙන් කිසිම රසායනික විද්‍යාත්මක විශ්ලේෂණ වාර්තාවක් නිකුත් කර නොමැති බවද තවදුරටත් කියා සිටී. මෙම ආයතන දෙක ගිවිසුම්ගත වීමකින් පසුව නැවට ගොස් සාම්පල් පරීක්ෂා කිරීමේ පහසුකම ආයතනය සතුව පවතින බවත්, මේ දක්වා එවැනි ගිවිසුම් ගතවීමක් සිදුවී නොමැති බවද කියා සිටී . ඒ අනුව යම් ප්‍රමිතියකින් යුතුව ගෑස් නිර්මාණය සිදුකිරීමටද පහසුවක් වන බව කියා සිටී.

05. සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ කරුණු දැක්වීම

- අප අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන අධීක්ෂණය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම මිල පිළිබඳ ගැටලු කලමණාකරනය කිරීම අදාල කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමක් සිදුවන බවත්, එම ආයතන ක්‍රියාත්මක වීම අධීක්ෂණය නොකරන බවත් කියාසිටිමි.තව දුරටත් අදහස් දක්වමින් කියා සිටින්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතන සම්බන්ධීකරණය කරමින් ගැටලු ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ඉටුකරන බවත් කියා සිටී.
- ගෑස් පිළිබඳ නව හඳුන්වාදීම් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ විෂය පථයට අයත් වුවත්, ලීටර් 18 සිලින්ඩරය වෙළඳපොලට හඳුන්වා දීමේදී අනෙකුත් ආයතන සමග සාකච්ජා කල බවත් කියා සිටී.යම් හෙයකින් අමාත්‍යාංශය ලබා දෙන උපදෙස් පිළිපැදීමක් සිදු නොකලහොත් එම ආයතනය පිළිබඳ අධිකරණයට කරුණු වාර්තා කිරීමේ හැකියාව තිබෙන බවද වැඩිදුරටත් කියා සිටී.

## 06. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ කරුණු දැක්වීම

- ගෑස්වල සංයුතිය පිළිබඳව මූලික පරීක්ෂණ සිදුකරමින් පවතින බවත්, ඉන් අනතුරුව විද්‍යාගාර පරීක්ෂණ සිදු කර වාර්තා ලබා දෙන බවත් කියා සිටින අතර ගෑස් පිළිබඳ ප්‍රමිති ආයතනය නිකුත් කරන වාර්තා පාරිභෝගික ආරක්ෂණ අමාත්‍යාංශය වෙත යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට නම් කර නිර්දේශ මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් යොමු වන්නේ නම් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒ පිළිබඳව ක්‍රියාත්මක විය හැකි බවත්ය. ගෑස් පිළිබඳව වර්තමානයේ පවතින ගැටලුව පිළිබඳව මහජන මත විමසා බැලීම 2021 සැප්තැම්බර් මස සිට ආරම්භ කර ඇති බව කියා සිටී.

- වර්තමානයේ භාවිතා වන ගෑස් සිලින්ඩරවලට අදාලව ශ්‍රී ලංකා ප්‍රමිතියක් ඇත. නමුත් ඊට පුරවනු ලබන ගෑස් කවරාකාර වියයුතුද යන්න පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රමිතියක් මෙතෙක් හඳුන්වා දී නොමැති බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

## 07. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කරුණු දැක්වීම

- ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු අංශය මගින් රටේ එල්.පී. ගෑස් අවශ්‍යතාවයෙන් 5% නිෂ්පාදනය කරන බවත්, ඒවා ලිට්‍රෝ සහ ලාෆ් යන සමාගම් දෙකට සමානව නිකුත් කරන බව කියා සිටී.එම ගෑස් නිෂ්පාදන නිවැරදිව පරීක්ෂා කර රසායනාගාර වාර්තා ඉදිරිපත් කරන බවත් වැඩිදුරටත් කියා සිටී.යම් අවස්ථාවක පරිභෝගික කටයුතු අධිකාරිය මගින් නියැදි පරීක්ෂාවට ලක් කරමින් වාර්තා ඉදිරිපත් කරන ලෙස දැන්වුවහොත්, එම පරීක්ෂණ කටයුතු මෙහෙයවීම අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව සිදුකරන බවත්, එම පරීක්ෂණ සිදු කිරීමට සුදුසු නිලදාරීන් සංස්ථාව සතු බවත් වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදි.මේ වන විට ගෑස් පිළිබඳ මතු වී ඇති ගැටලුව පැහැදිලි භාවයක් නොමැති බවත්, අප ආයතනය ගෑස් සමාගම් දෙක අතර පවතින ගිවිසුම් අනුව කිසිදු ගැටලුවක් නොමැතිව ක්‍රියාත්මක වන බවත්ය.

## 8. ශ්‍රී ලංකා පොලිසියේ කරුණු දැක්වීම

- ශ්‍රී ලංකා පොලිසිය ගෑස් ආශ්‍රිත පිපිරීම් පිළිබඳ එක් එක් සිදුවීමවලට අදාලව පරීක්ෂණ පවත්වගෙන යන බවත් ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉතා කඩිනමින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලබා දිය හැකි බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

## නිරීක්ෂණ

- මේ මොහොත වන විටත් ගෘහස්ථ ගෑස් භාවිතයේ දී පිපිරීම් හෝ ගිනි ගැනීම් සිදුවන බවත්,
- ගෑස් භාවිතයේ දී වසර ගණනාවක් තිස්සේ ගෑස් ආශ්‍රිත අනතුරු සිදුවී තිබුණද පසුගිය අප්‍රේල් මාසයේ සිට එහි විශාල වර්ධනයක් පවතින බව,
- දෛනිකව සිදුවන හානි ඉහළ යාමත් ඒ තුළ ජීවිත හානි සහ දේපල හානි සිදුවන බවත්,
- ගෑස්වල සංයුතිය පරීක්ෂා කිරීමට සුදුසු රසායනාගාර පහසුකම්වල අවශ්‍යතාවයක් පවතින බව විමර්ශනයේදී නිරීක්ෂණය වේ.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2009.09.30 දිනැති අංක 1621/19 දරණ ගැසට් නිවේදනය තුළින් ගෑස් සිලින්ඩරයක පැවතිය යුතු ගෑස් සංයුතිය පිළිබඳ දක්වා තිබෙන බවත්,
- එහි සඳහන් සංයුතිය සෑම ගෑස් සිලින්ඩරයකම පවතී ද යන්න පරීක්ෂා කිරීමේ සහ නියාමනය කිරීමේ ක්‍රමවේදයක් නොමැති බවත්,.
- සම්මත බරට අමතරව නව බර සඳහන් වන ගෑස් සිලින්ඩර වෙළඳපොළට හඳුන්වාදීමේදී, එය හඳුන්වාදීමට පෙර කිසිදු අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවයක් හෝ නීතිමය තත්වයක් නොමැති බවයි.
- ගෑස් සංයුතිය පරීක්ෂා කිරීමට තරම් පහසුකම් කාර්මික තාක්ෂණ ආයතනයේ රසායනාගාරය සතුව නොමැති බවයි.
- අනුමත සංයුතියේ වෙනස්වීම් සිදුවීම පිපිරීම් හා ගිනිගැනීම් වලින් අනතුරු සිදුවන බවත්, ප්‍රමිතියෙන් තොර උපාංග වැඩි වශයෙන් භාවිතා කරන බවත් නිරීක්ෂණය වේ.
- ප්‍රමිතියෙන් තොර ගෑස් ආශ්‍රිත උපාංග වෙළඳපොළ තුළ වැඩි වශයෙන් පවතින බවත් එම උපාංග නියාමනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදනවල දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්,
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් 2021/12/07 දින ගෑස් සමාගම් වෙත ලිපියකින් දන්වා ඇත්තේ ප්‍රශ්ණකාරී ගෑස් සිලින්ඩර වෙළඳපොළෙන් ඉවත්කර ගන්නා ලෙස හා ඒවා නැවත වෙළඳපොළට මුදාහැරීමක් නොකරන ලෙසටය. ඒ අනුව ඔවුන් ඒ ආකාරයෙන් කටයුතු කළද නැවත වෙළඳපොළට නිකුත් කර ඇත්තේ එම සිලින්ඩර වල මතුපිටින් කරන ලද වෙනස්කිරීම් සහිත බවත්,
- සමාගම් දෙකටම එරෙහිව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන එම නඩුකරණයන් තවමත් අධිකරයේ විභාග වෙමින් පවතින බවත්,
- ගෑස් මෙරටට ගෙන්වන අවස්ථාවේ දී ම නැව්වල තිබියදීම පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය ආයතනයක මැදිහත්වීමේ අවශ්‍යතාවය පවතින බවත්,
- ගෑස්වල නියමිත බර සංයුතිය වැනි නියාමනයන් සඳහා නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය පවතින බවත්,

- මහජනතාව/පාරිභෝගික ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනවල මැදිහත්වීම අවම තත්වයක පවතින බවත්, කඩිනම් මැදිහත් වීමේ ක්‍රමවේදයක අවශ්‍යතාවයක් ඇති බවත්,
- ගෘහස්ථ ගෑස් පරිභෝජනයේදී අනතුරු සිදුවීම නිසා ගෑස් පරිභෝජනය අවම විකල්ප උදුන් භාවිතයට ජනතාව හුරුවීම නිසා විකල්ප උදුන්වල මිළ පාලනයකින් තොරව පැවතීම නිසා ඒවා මිලදී ගැනීමට පාරිභෝගික ජනතාවට අධික මිලක් වැය කිරිමට සිදුවිමත් නිරික්ෂණය වේ.
- මේවන විට සිදුව ඇති අනතුරු/ජීවිත ආශ්‍රිත අනතුරු සිදුව ඇති හානිය විධිමත් ලෙස ගණන් බැලීමේ ක්‍රමවේදයක් දක්නට නොමැති බව.

පරීක්ෂණය තුළ ඉදිරිපත් වූ කරුණු සමස්තයක් ලෙස සැළකීමේදී වගඋත්තරකාර පාර්ශවයන් විසින් තමන් වෙත පැවරී ඇති නිල වගකීම ඉටුකිරීම නිසි ලෙස ඉටු නොවූ බවත්, සිදුවීම මත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 12(1) ව්‍යාවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කරදී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණයක් සිදුවී ඇති බවත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් මෙයින් නිගමනය කරනු ලැබේ.

## නිර්දේශ

### ලිට්‍රෝ ගෑස් පුද්ගලික සමාගම

01. ගෑස් ආශ්‍රිතව සිදුව ඇති අනතුරු පදනම් කරගෙන රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන හානි පිළිබඳ තොරතුරුවලට අදාල පාර්ශවයන් වෙත වන්දි ගෙවීම සඳහා කඩිනමින් මැදිහත්වීමක් සිදුකළ යුතුය.
02. ගෑස් ආශ්‍රිතව සිදුවන අනතුරු වලින් හානියට පත්වන පාර්ශවයන්ට සහන සැලසීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ හඳුන්වාදීමක් සිදුකර රක්ෂණ වැඩසටහන් සඳහා අඛණ්ඩ දායකත්වය ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස්කිරීම.
03. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරනු ලබන ගෑස් සිලින්ඩර සහ අනෙකුත් උපකරණ සඳහා සහ එම උපකරණ මගින් බෙදාහරින හෝ භාවිතා කිරීමට සලස්වන ගෑස් සඳහා නව ශ්‍රී ලංකා ප්‍රමිතිය අඳුනාගෙන එය ශ්‍රී ලංකාව තුළ භාවිතයට යාන්ත්‍රණයක් ආරම්භ කිරීම.
04. ලිට්‍රෝ ආයතය වෙතින් බෙදාහරින ගෑස් සිලින්ඩරවල නිෂ්පාදිත දිනය, කාණ්ඩ අංකය, සහ උපරිම සිල්ලර මිළ පැහැදිලිව පෙනෙන ලෙස ස්ටිකර් එකක් යදිය යුතුය.
05. සුරක්ෂිත ගෑස් භාවිතය වෙනුවෙන් සිදුකළ හැකි නියාමනයන් භාෂා 03න්ම ප්‍රදර්ශනය කිරීම.

### පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

01. ගෑස් අලෙවි ස්ථානවල පැවතිය යුතු අවම පහසුකම් පිළිබඳ නිර්ණායක සකස් කර එය පවත්වා ගෙන යාම සහ එලෙස පවත්වාගෙන නොයන ආයතන පිළිබඳ තොරතුරු ලබාදීමට දුරකථන අංකයක් හඳුන්වා දිමෙන් ශක්තිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීම.
02. ගෑස් සිලින්ඩර, ගෑස් ලිප්, රෙගුලේටර් සහ ගෑස් බට ආදිය ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලව සකස් කර අලෙවි වන්නේද යන්න අධීක්ෂණය කිරීම.
03. නිශ්චිත බරකින් යුතු ආරක්ෂිත ගෑස් සිලින්ඩර හඳුන්වා දීම සහ එම සිලින්ඩර වලට නැවත ගෑස් පිරවීම, ඒවායේ උපාංග පිළිබඳ නිසි ආකාරයෙන් නඩත්තු කටයුතු සිදුවන්නේ ද යන්න තහවුරු කිරීම.
04. වෙළඳපොළට නිකුත් කරන සෑම ගෑස් සිලින්ඩරයකම එහි කාණ්ඩ අංකය, ගෑස් පිරවීම සිදුකරන දිනය, උපරිම බර සහ සිල්ලර මිළ සඳහන් කිරීම තහවුරු කිරීම.
05. මේ වන විට සිදුව ඇති ගෑස් ආශ්‍රිත අනතුරුවලට මුහුණදුන් පුද්ගලයින් හා දේපල හානි සඳහා ඉතාමත් කඩිනමින් වන්දි ක්‍රමයක් සකස්කිරීම.
06. වෙළඳ පරමාර්ථ මුල් කරගෙන ගෑස් සමාගම් සිදුකරන ප්‍රචාරක දැන්වීම් මගින් මහජනතාව නොමඟ යැවීම පාලනය කිරීමට අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම.

07. ගෑස් අලෙවිය සඳහා වාර්ෂික බලපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම සහ එම නියාමන නිර්ණායක පිළිබඳ සමාලෝචන සිදුකිරීම.

08. මෙම නිර්දේශය ලිට්‍රෝ ගෑස් පෞද්ගලික සමාගම වෙත යොමුකර ඇති නිර්දේශයන් ලාෆ් ගෑස් ලිමිටඩ් වෙත යොමුකිරීම හා එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාත්මක වීම සිදුකළ යුතුය.

09. ගෑස් භාවිතය විකල්ප ලෙස යොදාගන්නා ද්‍රව්‍ය සහ උපාංග අලෙවියේදී ජනතාවට පීඩාකාරී ලෙස අධික මිළක් නියම කිරීම පාලනය කිරීමට සුදුසු මැදිහත්වීමක් කඩිනමින් සිදුකළ යුතුය.

10. පාරිභෝගිකයාගේ දැනුවත්වීම සඳහා සවිස්තරාත්මක පොත්පිංචක් හෝ පොස්ටරයක් ගෑස් සිලින්ඩරයක් මිළදී ගැනීමේ දී ලබාදිය යුතුය. එම පොත් පිංච හෝ පොස්ටරය තුළ පහත කරුණු අඩංගු විය යුතුය.

- ගෑස් පිළිබඳ සරල හැඳින්වීමක් හා එහි සංයුතිය,
- ගෑස් සුරක්ෂිතව භාවිතයට උපදෙස්,
- ගෑස් අනතුරකදී පිළිපැදිය යුතු උපදෙස්,
- ගෑස් අනතුරු සිදුවිය හැකි අවස්ථා පිළිබඳ දැනුවත් කිරීම,
- ගෑස් අනතුරකින් වැළකීමේ ක්‍රියාමාර්ග හා යම් පිලිස්සීමකදී ගතයුතු මූලික පියවරයන්,
- ගෑස් තිබිය යුතු ස්ථානය, ලිප හා ගෑස් සිලින්ඩර අතර දුර, භාවිතයට පෙර පිළිපැදිය යුතුදේ හා හදිසි දුරකථන අංක,

<u>සමූපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශ</u>

01. මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ විෂය පථය සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකර ගෑස් අලෙවිය සහ ඊට අදාළ සේවා විෂය පථයට ඇතුළත් කිරීමට කටයුතු කිරීම.

02. ගෑස් ආශ්‍රිත අනතුරු වලට අදාළව පාරිභෝගිකයින් සඳහා රක්ෂණ ක්‍රමවේදයක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ එක්ව සකස් කිරීම.

03. දීර්ඝ කාලීනව දුරස්ථ හෝ ව්‍යාපිජව භාවිතා කරන ගෑස් සැපයුම සඳහා සිලින්ඩර වෙනුවට පුද්ගල ආරක්ෂාව තහවුරු වන ආකාරයේ නළ පද්ධතියක් ඇති කිරීම සඳහා සුදුසු පියවර ගත යුතුය.

<u>ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය</u>

01. ශ්‍රී ලංකා කාළගුණ සහ දේශගුණ රටාවට ගැළපෙන ආකාරයේ ප්‍රමිතියකින් යුතු ගෑස් උඳුන් හඳුන්වාදීම

02. වාර්ෂික බලපත්‍ර අළුත්කිරීම හරහා ගෑස්වල අදාළ ප්‍රමිතිය පිළිබඳ සුපරීක්ෂා කිරීම.

03. ගෑස් ආශ්‍රිත උපාංග සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතියක් හඳුන්වාදීම.

<u>මහජන උපයෝගිතා කොමිෂන් සභාව</u>

01. ගෑස් ආශ්‍රිත අලෙවි, තොග ලබාගැනීම සහ බෙදාහැරීම මහජන උපයෝගිතා පිළිගත් බවට පත්කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම කළ යුතුය.
02. ගෑස් මිළ තීරණය කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂම මැදිහත්වීම් සිදුකිරීම.

<u>පොලිස් දෙපාර්තමේන්තුව</u>

01. තමන් වෙත වාර්තා වී ඇති ගෑස් අනතුරු වලට අදාළ සියළු තොරතුරු පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත කඩිනමින් සැපයීම
02. පාරිභෝගිකයනට අදාළ වන්දි ලබාදීමේ ක්‍රියාවලිය සඳහා කඩිනම් සහාය ලබාදීම.
03. වාර්තාවන ගෑස් අනතුරුවලට අදාලව සිදුකරන පරීක්ෂණ සම්බන්ධ තොරතුරු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

<u>කාර්මික තාක්ෂණ ආයතනය (ITI)</u>

01. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හඳුන්වාදෙන ප්‍රමිතියට අදාළ බවට ශ්‍රී ලංකාවේ භාවිතා වන ගෑස්වල තත්වය පවතීද යන්න තහවුරු කර ගැනීමට අවශ්‍ය රසායනාගාර පහසුකම් ආයතනය තුළ ඉතා කඩිනමින් ස්ථාපිත කිරීම.
02. ගෑස් වෙළඳාමේ නිරත සමාගම්වලට අවශ්‍ය රසායනාගාර පහසුකම් ලබාදීම.

<u>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව</u>

1. Lanka LPG (P-022) ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිපදවන එල් පී ජී ගෑස් සඳහා ශ්‍රී ලංකා ප්‍රමිතියක් ලබාගත යුතුය.
2. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් නිපදවන එල් පී ජී ගෑස් නිෂ්පාදනය පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ මහජන උපයෝගිතා කොමිෂන් සභාව යන ආයතන වල අධීක්ෂනයට ලක්විය යුතුය

<u>රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව</u>

01. ගැස් අශ්‍රිත පිපිරීම්වලට අදාළ සිද්ධීන් පොලීසිය සමඟ එක්ව හඳුනාගැනීම් සිදුකර අදාළ පාර්ශවයන් වෙත සිදුවී ඇති හානිය ඉතාමත් කඩිනමින් තක්සේරු කළ යුතුය. එම තක්සේරු කිරීමේ හානි වූ උපකරණවල වර්ධනය වෙළඳපොළ වටිනාකම සලකා එය සිදුකළ යුතුය.
02. ගැස් අනතුරු පදනම් කරගෙන සිදුව ඇති හානිය පිළිබඳ තක්සේරු කිරීම්, පාරිභෝගික ආරක්ෂණ අධිකාරිය සහ වගකිව යුතු ගැස් වෙළඳ ආයතනය වෙත දැන්විය යුතුය.

**<u>2022 මැයි මස 02</u>** වන දිනට පෙර මෙකී නිර්දේශයන් ක්‍රියාත්මක කර ඒ පිළිබද වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

විනිසුරු රෝහිණී මාරසිංහ,
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු / සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

වෛද්‍ය නිමල් කරුණාසිරි, 3/3
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka